# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 2483/05 - 2026 අප්‍රේල් මස 07 වැනි අඟහරුවාදා - 2026.04.07**

**(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)**

# IV (ආ) වැනි කොටස - පළාත් පාලනය

## පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනත යටතේ දැන්වීම්

**(262 වන අධිකාරය) පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ 66අ(1) (ආ) වගන්තිය යටතේ**
**අලව්ව ප්‍රාදේශීය සභාවේ**
**සභික ධුරයේ පුරප්පාඩුවක් පිරවීම**

අවසර නොලබා මාස තුනක කාලසීමාවක් තුළදී සභා රැස්වීම් සඳහා සහභාගී නොවීම හේතුකොට ගෙන අලව්ව ප්‍රාදේශීය සභාවට තෝරා එවා ඇති සභිකයෙකුගේ ධුරයක් පුරප්පාඩු වී ඇති හෙයින් ද;

ඉහත කී ආඥාපනතේ 66අ(1) වගන්තිය යටතේ අලව්ව ප්‍රාදේශීය සභාව සඳහා තෝරා එවා ඇති සභිකයෙකු ලෙස පත් වූ සේනාරත්න මුදියන්සේලාගේ යසින්තා සජීවනී සේනාරත්න මහත්මිය අයත් වන්නා වූ ශ්‍රී ලංකා පොදුජන පෙරමුණ නම් පිළිගත් දේශපාලන පක්ෂයේ ලේකම්ට දින තිහ (30) ක කාල පරිච්ඡේදය ඇතුළත පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ (262 වන අධිකාරය) 9 වගන්තිය යටතේ නුසුදුස්සෙකු වී නොමැති අපේක්ෂකයෙකු, සභිකයෙකු වශයෙන් තෝරා පත් කර ගනු ලැබිය යුතුයැයි ප්‍රකාශ කරනු ලැබිය යුතු වූ ද, එම පක්ෂයට අයත් වන්නා වූ ද, එම අලව්ව ප්‍රාදේශීය සභාව සඳහා තෝරා එවිය යුතු සභිකයා පිළිබඳව තීරණය කිරීමට මා විසින් නියම කරනු ලැබ ඇති හෙයින් ද;

ඉහත කී පිළිගත් දේශපාලන පක්ෂයේ ලේකම් විසින් එම පුරප්පාඩුව පිරවීම සඳහා ජයසුන්දර හේරත් මුදියන්සේලාගේ ලක්ෂ්මි සංජීලා ජයසුන්දර මහත්මිය නම් කිරීමේ ස්වකීය තීරණය දන්වනු ලැබ ඇති හෙයින් ද;

අලව්ව ප්‍රාදේශීය සභාවේ තේරීම්භාර නිලධාරී රත්නායක මුදියන්සේලාගේ හරේන්ද්‍ර බණ්ඩාර රත්නායක වන මම, පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ (262 වන අධිකාරය) 66අ(1) (ආ) වගන්තිය ප්‍රකාර ක්‍රියා කරමින් ජයසුන්දර හේරත් මුදියන්සේලාගේ ලක්ෂ්මි සංජීලා ජයසුන්දර මහත්මිය, අලව්ව ප්‍රාදේශීය සභාවට තෝරා එවා ඇති සභිකයෙකු ලෙස මෙයින් ප්‍රකාශ කරමි.

**ආර්. එම්. එච්. බී. රත්නායක,**
තේරීම්භාර නිලධාරී,
අලව්ව ප්‍රාදේශීය සභාව.

2026 අප්‍රේල් මස 07 වැනි දින,
දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලය,
කුරුණෑගල.

EOG 04 - 0044

1A - PG 7592 — 08 (2026/04) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.
*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*